ඇමුණුම - I

# නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය
# දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
## ගම්මාන සම්පත් පැතිකඩ සකස් කිරීමේ උපදෙස් පත්‍රිකාව

සම්පත් පැතිකඩ සකස් කිරීමේදී පහත සඳහන් උපදෙස් අනුව, කටයුතු කරන ලෙස දැනුම් දෙන අතර, සම්පත් පැතිකඩෙහි පැහැදිලි කල යුතු තැන් පමණක් ඔබගේ පහසුව සඳහා මෙම උපදෙස් පත්‍රිකාවට ඇතුලත් කර ඇති බව වැඩිදුරටත් සඳහන් කරමි.

**01.** පිහිටීම

1.13 ගම්මානයේ සිතියම

- ගම්මානයේ සිතියමක් ඉදිරිපත් කරන්න.
- සිතියමෙහි ගම්මානයේ මාර්ග, වැව්, ගංගා, වගාබිම්, ආගමික ස්ථාන, පාසල් හා පොදු ගොඩනැගිලි හා විශේෂිත ස්ථාන ඇත්නම් ඒවාද ඇතුලත් කරිම සුදුසු වේ.
- සිතියම ඉදිරිපත් කිරීමේදී දැනට භාවිතා කරන පරිමානයන් (Scale) දිශාව, වර්ණ භාවිතය යන ආදිය සම්මත ක්‍රමයට ඉදිරිපත් කිරීම සුදුසු වේ.

**03.** භූමි පරිභෝජනය

3.1 ගම්මානයේ ඇති සියළුම ඉඩම් භාවිතය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන්න

3.3 රජය සතු ඉඩම් පරිහරනය පිළිබඳ තොරතුරු

- ඉඩම පිහිටි ස්ථානය - භෞතිකව ඉඩම පිහිටා ඇති ස්ථාන නිශ්චිතව සඳහන් කරන්න.
  (උදා. තිසර මාවතේ 3 වන මංසන්දියේ 2 වන විදුලි කණුව ඉදිරිපිට)
- භාවිතයේ ස්වභාවය (කේතය) - ඉදිරිපත් කර ඇති කේතයන් භාවිතා කරන්න

3.4 රජය සතු පරිහරනය නොකරන ගොඩනැගිලි පිළිබඳ විස්තර

- පරිභෝජනය නොකරන ගොඩනැගිල්ලේ පිහිටීම - ගොඩනැගිල්ල භෞතිකව පිහිටා ඇති ස්ථානය සඳහන් කරන්න

3.5 රජය සතු පරිහරනය නොකරන ඉඩම් පිළිබඳ විස්තර

- පරිහරනය නොකරන ඉඩමේ පිහිටීම - භෞතිකව ඉඩම පිහිටි ස්ථානය සඳහන් කරන්න

**04.** **ජනගහනය**

4.2.1 ආධාරලාභී පවුල් සංඛ්‍යාව

4.2.1.2 වෙනත් ආධාරලාභී පවුල් සංඛ්‍යාව

- සමෘද්ධි ආධාර හැර රජය විසින් ලබා දෙන වෙනත් සහනාධාර ලබන්නේනම් එම පවුල් සංඛ්‍යාව මහජන ආධාර වර්ගය අනුව වෙන වෙනම සඳහන් කරන්න.

4.2.1.3 ආධාර ලැබිය යුතු, එහෙත් නොලබන පවුල් සංඛ්‍යාව

- පවුල් සංඛ්‍යාව දැක්වීමේදී පවුලේ සාමාජික සංඛ්‍යාවද වෙනම සඳහන් කරන්න.

**16.** **කර්මාන්ත**

16.1 සුළු, මධ්‍ය හා මහා පරිමාන කර්මාන්තශාලා පිළිබඳ තොරතුරු

- ප්‍රදේශයේ පවතින සුළු, මධ්‍ය හා මහා පරිමාන කර්මාන්තශාලා පිළිබඳ තොරතුරු වෙන වෙනම සඳහන් කරන්න.

16.2 ගෘහ කර්මාන්ත පිළිබඳ තොරතුරු පහත පරිදි වෙන වෙනම සඳහන් කරන්න.

- පාරම්පරික කර්මාන්ත - උදා. මැටි, පිත්තල, රන් රිදී, වේවැල් වැනි
- පාරම්පරික නොවන කර්මාන්ත  - උදා. කාර්මික, කෘෂිකාර්මික, සත්ව පාලන, ධීවර හා අලෙවි වැනි

**17.** **අධ්‍යාත්මික හා සමාජ සංවර්ධනය**

17.5 පිළිසරණක් නොමැති වැඩිහිටියන්

17.5.1 ගමේ සිටින පිළිසරණක් නොමැති වැඩිහිටි සංඛ්‍යාව

- රැකබලා ගැනීමට කිසිවෙකුත් නොමැතිව අසරණව සිටින වැඩිහිටියන් වේනම් ඔවුන්ගේ සංඛ්‍යාව ස්ත්‍රී පුරුෂ භාවය අනුව සඳහන් කරන්න

**18.** **සංචාරක කර්මාන්තය**

18.2 සංචාරකයන් සඳහා ඇති පහසුකම්

- ප්‍රවාහන පහසුකම් - සංචාරකයින් ප්‍රවාහනය කිරීම සඳහා භාවිතා කරන බස් රථ, වෑන් රථ හා වෙනත් මාර්ගයන් වේනම් ඒවා වෙන වෙනම සඳහන් කරන්න
- මාර්ගෝපදේශ - සංචාරකයින් සඳහා මග පෙන්වන මාර්ගෝපදේශකයින් සංඛ්‍යාව සඳහන් කරන්න
- වෙළඳපොල පහසුකම් - සංචාරකයින්ගේ අවශ්‍යතා සපුරාලිය හැකි වෙළඳපොළවල් හා මධ්‍යස්ථාන වේනම් ඒවා වෙන වෙනම සඳහන් කරන්න

**19.** **පසුගිය වසර 5 තුල ආයෝජනය**

19.1 සමස්ථ ආයෝජනය

- 2010 සිට 2014 දක්වා වසර 5 තුල ගම්මානයේ සමස්ථ ප්‍රාග්ධන ආයෝජනය වෙන වෙනම සදහන් කරන්න

19.2 මුල්‍ය ප්‍රභවය අනුව ආයෝජන සාරාංශය

- 2010 සිට 2014 දක්වා වසර 5 තුල ගම්මානයේ සමස්ථ ආයෝජනය එක් එක් ආයතන අනුව සිදු කර ඇති ආකාරය වෙන වෙනම දක්වන්න

19.3 අංශ අනුව ආයෝජන සාරාංශය

- 2010 සිට 2014 දක්වා වසර 5 තුල ගම්මානයේ සමස්ථ ආයෝජනය එක් එක් අංශ අතර බෙදීගොස් ඇති ආකාරය ව්‍යාපෘති සංඛ්‍යාව අනුව සදහන් කරන්න

19.4 ව්‍යාපෘති අනුව ආයෝජන සාරාංශය

- 2010 සිට 2014 දක්වා වසර 5 තුල ඉහත 19.3 යටතේ දක්වන ලද එක් එක් අංශවල ආයෝජනය ව්‍යාපෘතීන් අනුව, ව්‍යාපෘති සංඛ්‍යාවද සමග වෙන වෙනම සදහන් කරන්න

**20.** **ගම දියුණු කිරීම සදහා කරනු ලබන සංවර්ධන යෝජනා (ප්‍රමුඛතාවය අනුව)**

- අනාගතයේදී ගම දියුණු කිරීම සදහා යෝජිත සංවර්ධන යෝජනා එක් එක් අංශ අනුව ව්‍යාපෘතීන් ප්‍රමුඛතාවය අනුව වෙන වෙනම සදහන් කරන්න. එම ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේ වගකීම් දරන ආයතනද සදහන් කරන්න

**21.** **වත්මන් ගැටළු**

- ගම්මානයේ පවතින ගැටළු එක් එක් අංශ හා ව්‍යාපෘතීන් අනුව සදහන් කරන්න

**පොදු කරුණු**

- ගමට අදාල තොරතුරු පමණක් ඇතුලත් කරන්න
- එක් ගමකට වසම් කිහිපයක් අයත් වන්නේනම් එක් එක් වසම සදහා වෙන වෙනම සම්පත් පැතිකඩවල් සකස් කල යුතුය.